# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2125/9 - 2019 මැයි මස 27 වැනි සඳුදා - 2019.05.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ වලපනේ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන වලපනේ ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ වලපනේ ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ දමිත් සිරි ෆර්නැන්ඩිස් අබේවික්‍රම අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම වලපනේ ප්‍රාදේශීය සභාවේ තෝරා ඒවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා බෝධියා බදුගේ චන්ද්‍රිකා කුමාරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වලපනේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, පුලස්ති පතිරණ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද වීමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් බෝධියා බදුගේ චන්ද්‍රිකා කුමාරි, වලපනේ ප්‍රාදේශීය සභාවට තෝරා ඒවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පුලස්ති පතිරණ,
තේරීම්භාර නිලධාරී,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

06 - 212


1A - G 30162 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*